# සබරගමු පළාත් අධ්‍යාපනය දෙපාර්තමේන්තුව

**1 ශ්‍රේණිය (ජූලි 2 සතිය)**

**විෂය සමගාමී ක්‍රියාකාරකම්**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

සැකසුම-කේ.ඩබ්ලිව්.එස්.දර්ශිකා විමලරත්න මෙනවිය,කෑ/දෙහි/ශ්‍රී සීලානන්ද මහා විද්‍යාලය,බුලත්කොහුපිටිය

## <u>කඩදාසි පබළු මාලයක් හදමු.</u>

පබළු හදාගන්න අපිට මේ දේවල් ඕනි වෙනවා

- පරණ පත්තර පිටු කීපයක්
- ගම්
- ඉරටුවක් හෝ සිහින් කම්බි කූරක්
- ජලය
- කුකුළ් සායම්

* දැන් පත්තර කොළ කුඩා කෑලිවලට ඉරලා වතුර භාජනයකට දාන්න.

* ඒකටම ගම් ටිකකුත් කලවම් කරන්න.

* ඒකටම සායම් ටිකකුත් එකතු කරලා පල්ප් එකක් වගේ හොඳට අනන්න.හරියට ක්ලේ/මැටි වගේ වෙනකම්.

* දැන් මේ හදපු පල්ප් එකෙන් කඩල ඇට වගේ තරමට පොඩි බෝල හදාගන්න පුළුවන්.

* මේ බෝල හදන ගමන්ම ඉරටුවේ හරි කම්බියේ එකට එක නොගෑවෙන විදිහට අමුණා ගන්න මතක තියාගන්න.

* දැන් පබළු වේලෙනකන් තියලා කැඩෙන්නේ නැති වෙන්න ඉරටුවෙන්/කම්බියෙන් ගලවලා ගන්න.

* දැන් ඔයාලා හදපු පබළු එකින් එක නූලකට අමුණලා ලස්සන මාලයක් හදාගන්න ඔයාලට පුළුවන්.

* විවිධ හැඩයේ විවිධ පාටින් පබළු හදාගෙන මාල හදාගන්නත් ඔයාලට පුළුවන්.

* දැන් ඔයාලා හදපු මාලේ කරට දාලා ඔයාලගේ ලස්සන බලන්න.අනිත් අයටත් පෙන්නන්න.